**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - 2024**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ (“අධිකාරිය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 95 ඡේදය අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණත හෙළිදරව් කළ යුතු ප්‍රාග්ධන සංචිත, අයහාර සංචිත, පාරිභෝගික ආරක්ෂණ අරමුදල හා සමුච්චිත ලාභය/අලාභය යන අයිතමවල වටිනාකම පිළිවෙළින් රු.10,102,000, රු.17,048,000, රු.63,190,913, රු. 514,903,552 ක් මුහුණත හෝ සටහන් මඟින් වෙන් වෙන්ව හෙළිදරව් නොකර ප්‍රාග්ධනය හා සංචිත වශයෙන් රු.605,244,465 ක එකතුවක් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ප්‍රාග්ධන හා අයහාර සංචිත වෙන් වෙන්ව ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණත හෝ සටහන් මඟින් ප්‍රාග්ධන හා අයහාර සංචිත වෙන් වෙන්ව හෙළිදරව් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01හි 99 ඡේදය ප්‍රකාර වර්ෂයට අදාළ වියදම් එම වසරේ ගිණුම්ගත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබූ 2020 සිට 2023 දක්වා වර්ෂ 04 ට අදාළ එකතුව රු.1,216,750 ක් වූ නීති වියදම්, අදාළ වර්ෂවලදී හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ | නීති කටයුතු අවසන් වූ වසර පදනම් කරගෙන නීතිපති දෙපාර්තමේන්තුව ඉන්වොයිසි පත් නිකුත් කරන බැවින් 2024 වර්ෂයේදී ගෙවන ලද නීති ගාස්තු එම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත. පැවති කුලී ගිවිසුම 2024.09.30 දිනෙන් අවසන් වී තිබූ අතර ඉදිරි කාල | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව වර්ෂයට අදාල සියළු වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුව සඳහා වූ ගොඩනැගිලි කුලී වියදම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබීම හේතුවෙන් රු.8,716,125 කින් වියදම අඩුවීමෙන් වර්ෂයේ ඌනතාවයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | සීමාවට වලංගු කුලී ගිවිසුමක් සහ නිශ්චිත කුලී ප්‍රමාණය පිළිබඳ දැනුම් දීමක්ද නොතිබූ බැවින් එම කාල සීමාව සඳහා වෙන්කිරීම සිදු නොකරන ලදි. | |
| (ඇ) වර්ෂය තුළ අයහාර ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.1,745,832 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 ප්‍රකාරව හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද ආදායමක් ලෙස හඳුනා නොගෙන විලම්බිත ආදායමක් ලෙස දක්වා තිබුණි. ඉකුත් වර්ෂවල භාණ්ඩාගාර ප්‍රදානයන් යටතේ මිලදීගෙන තිබූ වත්කම්වලට අදාළ රු.61,735,225ක වටිනාකම විලම්බිත ආදායමක් ලෙස 2024 ජනවාරි 01 දිනට දක්වා තිබුණු අතර, අදාළ වටිනාකම ඉකුත් වර්ෂ අදායම් ලෙස හඳුනාගත යුතු වුවත් එසේ කර නොතිබුණි. උක්ත ප්‍රදානයන්ට අදාළ සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය වටිනාකම වූ රු. 24,302,242 ගැලපීමෙන් පසු 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය ලෙස රු.39,178,817ක් විලම්බිත අයහාර ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා ලද ප්‍රදානයන් මූල්‍ය ප්‍රකාශනවල විලම්භිත ආදායම් ලෙස යොදා තිබීම නිසා මෙම දෝෂය හටගෙන ඇති අතර, එය නිවැරදි කිරීමට කටයුතු කරමි<br>. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව අයහාර ප්‍රදාන හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 19හි 76 ඡේදය ප්‍රකාරව රු.166,977,190 ක් වූ පාරිතෝෂික වෙන් කිරීම්වලට අදාළ පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳියාව සහ සම්බන්ධ ප්‍රවර්තන සේවා පිරිවැයේ වර්තමාන අගය ගිණුම්වල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | විගණන නිර්දේශ අනුව පාරිතෝෂික වෙන් කිරීම සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව පාරිතෝෂික වෙන්කිරීමට අදාළව වර්තමාන අගය ගිණුම්වල දැක්විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වැයකළ එකතුව රු.417,470 ක් වූ ඉන්ධන වියදම්, වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ඉන්ධන අග්‍රිම ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් සටහන් යෙදීම අතපසුවීම මත මෙම දෝෂය හටගෙන ඇත. නිවැරදි ගිණුම් සටහන් තැබීමට උපදෙස් ලබාදී ඇත. | වර්ෂයට අදාල ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| මෙහෙයුම් සඳහා වූ අත්තිකාරම් | 5,168,527 | සේවකයන් හා උසාවිවල ඇති උපාය දූත මුදල් සහ දිස්ත්‍රික් කාර්යාලවල පවතින නොපිය වූ අත්තිකාරම් සඳහා උපලේඛන | අග්‍රිම අත්තිකාරම්හි ශේෂයන් පවතින්නේ නම් සෑම අග්‍රිමයක්ම මූල්‍ය වර්ෂය අවසානයේදී ප්‍රධාන කාර්යාලයට පියවීමට උපදෙස් ලබාදී ඇත. | අත්තිකාරම් සඳහා විධිමත්ව උපලේඛන පවත්වා ගත යුතු අතර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ සේවකයන් 23 දෙනෙකු සඳහා ලබා දී තිබූ එකතුව රු.694,576 ක් වූ ආපදා ණය අවුරුදු 01 සිට 15 දක්වා කාල පරාසයක් තුළ අය නොවී පැවතුණි. එම සේවකයන් අතරින් 04 දෙනෙකු වැඩ තහනමට ලක් වී ඇති නිලධාරීන් වූ අතර, ඔවුන්ගෙන් අයවිය යුතු රු.384,693ක් වූ ආපදා ණය මුදල් හා පොලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර සේවයන් ඉවත් වී තිබූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු.13,888ක් වූ ආපදා ණය හා පොලිය යන ශේෂයන් අයකර | මෙම සේවකයන් 23 දෙනා අතරින් 15 දෙනෙකු සේවයේ සිටින බැවින් ණය වාරික අයකිරීම් සිදු කරමින් පවතී. වැඩ තහනමට ලක් වී ඇති සේවකයින්ගේ විමර්ශන කටයුතු අවසන්ව නොමැති බැවින් හිඟ ශේෂ විමර්ශන අවසන් වූ පසුව අයකර ගැනීමට කටයුතු කරනු ඇත. සේවයෙන් ඉවත් වී ඇති එක් අයෙකුගේ ශේෂ පාරිතෝෂිකයෙන් අයකර | සේවකයන් ඉවත්ව යාමේදි අයකර ගත යුතු ණය ශේෂ හඳුනාගත යුතුය. ණය ශේෂ හිඟහිටි කාලයට අදාළව පොලී අඛණ්ඩව අයකර ගත යුතුය. |

| | |
|---|---|
| ගැනීමෙන් තොරව ඔවුන් දෙදෙනා නිදහස් කර තිබුණි. | අනෙක් නිලධාරින්ට හිඟවාරික ගෙවන ලෙස දැනුම් දී ඇත. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවුරුදු 4 සිට 6 දක්වා පැරණි එකතුව රු.275,295 ක් වූ ගෙවිය යුතු ශේෂ 03ක් නිරවුල් කිරීමෙන් තොරව ගෙවිය යුතු තැන්පතු තුළ රඳවාගෙන තිබුණි. | මෙම ශේෂ අදාල පාර්ශවයන් වෙත නිදහස් කිරීමට උපදෙස් ලබාදී ඇත | රඳවා ගත් ශේෂ නිරවුල් කිරීමට විධිමත් සහ කඩිනම් පියවර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වගන්තිය යටතේ 2021 ජූනි 11 දිනැති අංක 2231/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ලබා දුන් විශේෂ විධානය | 2021 ජූනි 15 දින සිට දිවයිනේ විවිධ දිස්ත්‍රික්කවල පිහිටි ගබඩා අධිකාරිය විසින් ලියාපදිංචි කළ යුතු වුවත් දිවයිනේ සියළු ගබඩා අධිකාරිය විසින් ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | දිවයින තුළ පිහිටි සියලු තොග ගබඩා ලියාපදිංචි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ II කොටසේ 48 පරිච්ඡේදයේ 22.4 හා 27.13 වගන්ති | (i) අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වීමෙන් පසුවත් විනය නියෝග නිකුත් කරන තෙක් විනය පරීක්ෂණ පවත්වාගෙන යා යුතු වුවද වැඩ තහනමට ලක්කර තිබූ සේවකයන් 04 දෙනෙකුට අදාලව පැවති අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වූ පසු ඔවුන් සම්බන්ධයෙන් | ආයතන සංග්‍රහය I කාණ්ඩය, I පරිච්ඡේදය, XVII යටතේ "රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවා නියුක්ත වුවෙකු රාජ්‍ය නිළධර සංඛ්‍යාවෙහිලා නොගැනෙති" ලෙස සඳහන්ව ඇති බැවින් රජයේ නිළධාරීන් නොවන මෙම අධිකාරියේ සේවකයින් සඳහා මෙම වගන්තිය බල නොපැවැත්වේ. ස්වාධීන වශයෙන් විනය | 2021 නොවැම්බර් 16 දිනැති හා 2021/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මගින් ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 2.3 අනුව සියළු රාජ්‍ය ව්‍යාවසායන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද |

| | | |
|---|---|---|
| පවත්වා තිබූ විනය පරීක්ෂණ කටයුතු අවසන් කිරීමෙන් තොරව එම සේවකයන් නැවත සේවයේ පිහිටුවා තිබුණි.<br><br>(ii) 2018 වර්ෂයේ දී විමර්ශන නිලධාරීන් බඳවා ගැනීමේ දී සිදු වූ අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පවත්වා අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) ට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර 2021 පෙබරවාරි 03 දින සිට තාවකාලිකව සේවය අත්හිටුවා තිබුණි. අදාල විධිමත් විනය පරීක්ෂණය සඳහා 2021 මාර්තු 23 දින විනය පරීක්ෂණ නිලධාරියෙකු පත්කර තිබුණද, අවුරුදු 02 මාස 06ක් ඉක්ම වූ පසුවද පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබූ අතර, එම විනය පරීක්ෂණ නිලධාරියා ඉවත් කර 2023 ඔක්තෝබර් 31 දින නැවතත් නව විනය පරීක්ෂණ නිලධාරියෙකු පත්කර තිබුණි. එම විනය පරීක්ෂණය අවසන් කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව විනය පරීක්ෂණය | පරීක්ෂණයක් පවත්වා ගැනීම අධිකාරියේ සේවකයින් සඳහා අනිවාර්ය නොවන අතර මහාධිකරණ තීන්දුව අනුව අධිකාරියේ විනය බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.06.28 දින පැවති රැස්වීමේදී මෙම සේවකයින් නැවත සේවයේ පිහිටු වීමට හා අල්ලස් චෝදනා සම්බන්ධයෙන් පවතින සාක්ෂි අනුව ඔවුන්ට දඬුවම් වශයෙන් වැඩ තහනම් කාලයට හිඟ වැටුප් නොගෙවීමට තීරණය කර තිබුණි. | පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහයක් තිබිය යුතු වුවත් අධිකාරිය විසින් එවැන්නක් සකස් කර නොමැති බැවින් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වුවද විනය පරීක්ෂණවල කටයුතු අඛණ්ඩව පවත්වා අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නවතා 2024 මැයි 24 දින උක්ත සේවකයා සේවයේ පිහිටුවා තිබුණි. | | |
| (ඇ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 66(2)(ඇ) හා 66(3)(ආ) | සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද මුදලින් රු.1,745,833 ක් භාණ්ඩාගාර ලේකම්ගේ හෝ ඔහු විසින් බලය දී ඇති වෙනත් නිලධාරියෙකුගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වැය කර තිබුණි. | ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ඉල්ලීමේ අදහසින් පුනරාවර්ථන වියදම් ගිණුමෙන් ප්‍රාග්ධන වියදම් ගිණුමට අදාළ මුදල බැරකිරිම සිදු කර තිබුණි. ප්‍රතිපාදන මාරු කිරීම සිදු කල නොහැකි බව දන්වා සිටීම හේතුවෙන් මාරුකිරීමට අදාල සටහන නිවැරදි කළ යුතුව ඇත. | රජයේ ප්‍රතිපාදන ලබා ගත් අරමුණට හැර වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමේදී විධිමත් පරිදි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 373 | දිස්ත්‍රික් කාර්යාල 07 ක එකතුව රු. 951,575ක් වූ ඉන්ධන අග්‍රිම ශේෂද දිස්ත්‍රික් කාර්යාල 8ක එකතුව රු. 151,578 ක් වූ උපාය දූත මුදල් අග්‍රිම ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලය වෙත පියවා නොතිබුණි. | අත්තිකාරම් ශේෂ වර්ෂය අවසානයේදී ප්‍රධාන කාර්යාලයට පියවීමට උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් ශේෂයන් නියමිත දිනට පියවීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ඈ) 2021 නොවැම්බර් 16 දිනැති 2021/01 අංක සහිත රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ හඳුන්වා දුන් රාජ්‍ය | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් 2023 හා 2024 වර්ෂවලට අදාල වාර්ෂික වාර්තා 2025 අගෝස්තු 30 වනවිටත් | 2023 වාර්තාව අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. 2024 වාර්තාව පරිවර්තන කටයුතු සිදුකරමින් පවතී. | 2023 හා 2024 වාර්ෂික වාර්තා කඩිනමින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ව්‍යාපාර සඳහා වන මාර්ගෝපදේශය | පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,699,000 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.66,085,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.89,784,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ ප්‍රදාන රු.43,419,000 කින්, දඩ ආදායම් රු.29,359,000 කින් හා අනෙකුත් ආදායම් රු.20,128,000 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම 2004 වර්ෂයේදී ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂය වන විට වසර 20 ක් ගත වී ඇතත් එම සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි. | පනත සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙතද, නීතිපති දෙපාර්තමේන්තුව වෙතද, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයටද විවිධ නිර්දේශ හා අනුමැති සඳහා අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කර ඇත. 2025.04.29 දින අමාත්‍යාංශයේ දී මීට අදාළව අමාත්‍යාංශ නිලධාරීන් සහ අධිකාරියේ සහභාගිත්වයෙන් රැස්වීමක් පවත්වා ඇත. ඒ අනුව පනත සංශෝධනයට අදාළ ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි පනත සංශෝධනය කර අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පනතේ 27 වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන රුපියල් ලක්ෂයක් නොඉක්මවන වාර්ෂික ගාස්තුවක් ගෙවීම මත සෑම වෙළෙන්දෙකුම අධිකාරියෙහි ලියාපදිංචි විය යුතු වුවද අධිකාරිය විසින් වෙළෙඳුන් ලියාපදිංචි කිරීම සිදුකර නොතිබුණි. | වෙළෙන්දන් ලියාපදිංචි කිරීම සඳහා කටයුතු කරමින් පවතින අතර, මේ වනවිට වෙළෙන්දන් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංග සහ දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතී. | පනතේ ප්‍රතිපාදන අනුව සෑම වෙළෙන්දෙක්ම අධිකාරියෙහි ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනාරක්ෂිත හා තත්ත්වයෙන් බාල නිෂ්පාදනවලින් පාරිභෝගිකයන් සුරක්ෂිත කිරීම සඳහා හඳුනාගත් නිෂ්පාදන කීපයක් සම්බන්ධයෙන් ආරක්ෂිත ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ස්විට්සර්ලන්තයේ සමාගමක් සමඟ 2014 ජනවාරි මස 24 දින ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සම්බන්ධයෙන් නිකුත් කර තිබූ විධාන අංක 49 නිශ්ප්‍රභා කරවා ගැනීම සඳහා භාණ්ඩ නිෂ්පාදන සමාගම් කීපයක් විසින් අධිකාරියට විරුද්ධව මහා අධිකරණයේ ගොනු කර තිබූ ඉල්ලුම්පත්‍රය සඳහා මහා අධිකරණය මගින් විධානය ක්‍රියාත්මක කිරීම වලක්වමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම හේතුවෙන් සමාගම සමඟ එළඹි ගිවිසුමට අනුකූලව ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකිවී තිබුණි.<br>ගිවිසුම ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ගිවිසුම්ගත සමාගම විසින් ඒකපාර්ශවීයව ගිවිසුම අවලංගු කර ගිවිසුම් ප්‍රකාරව සම්පූර්ණ ආයෝජන මුදල වන රු.බිලියන 2.716 ක මුදලක් ගෙවන ලෙස ඉල්ලා අධිකාරියට එරෙහිව 2018 වර්ෂයේදී ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. බේරුම්කරණ නඩුව සඳහා අවසාන ප්‍රදානය එනම්, 2022 මැයි 10 දින ලබා දී තිබුණු නියෝගය අනුව අධිකාරිය විසින් සමාගම වෙත රු.බිලියන 2.716 ක් ද, බේරුම්කරණ ගාස්තුව වශයෙන් ඇ.ඩො. | නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත අධිකාරිය විසින් CHC 626/2023 නඩුකරය 2022 ජූලි 07 වන දින පවරා ඇත. 2024.05.07 දින පැවති පොදු ව්‍යාපාර කමිටු (COPE) රැස්වීමේදී, ලබාදුන් නියෝග පරිදි ගිවිසුම ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් යම් අක්‍රමිකතා සිදුව ඇත්දැයි බැලීමට අධිකාරිය විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇත. අත්සන් කරන ලද ගිවිසුම මඟින් කිසියම් අක්‍රමිකතා හෝ විෂමාචාර ක්‍රියා සිදුව තිබේද යන්න සොයා බලා වාර්තා කිරීම සඳහා මූලික විමර්ශනයක් සිදු කිරීමට අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී ගනු ලැබූ තීරණයට අනුව මූලික විමර්ශන නිලධාරියෙක් පත් කර තිබුණ ද මූලික විමර්ශනය පැවැත්වීමේ ප්‍රමාදය හේතුවෙන් වෙනත් මූලික විමර්ශන නිලධාරියකු මේ වන විට පත් කර ඇත. මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර තිබූ අතර එය ඔවුන්ගේ විෂය පථයට ආදාළ නොවන බැවින් නඩු කටයුත්ත අල්ලස් හා දූෂණ විමර්ෂණ ඒකකය වෙත යොමු කර ඇති බව දන්වා ඇත. | ක්‍රියාත්මක කිරීමේ හැකියාව තහවුරු කර ගැනීමෙන් පසුව ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතු අතර අභ්‍යන්තර පරීක්ෂණයක් තුළින් වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 325,000 ක මුදලක් ද ගෙවිය යුතු විය. බේරුම්කරණ නඩුවේ අවසාන ප්‍රදානයට එරෙහිව 2022 ජූලි 07 දින අධිකාරිය විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ පෙත්සමක් ගොනු කර තිබූ අතර එය තවදුරටත් විභාග වෙමින් පැවතුණි. තවද 2024 මැයි 07 දින පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කමිටු රැස්වීමේදී ද ගිවිසුම සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විනයානුකූලව සහ නීතිමය පියවර ගන්නා ලෙස නියෝග කර තිබුණද අධිකාරිය විසින් අභ්‍යන්තර විමර්ෂණයක් පවත්වා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. | | |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලය 667 ක් වූ අතර, ඉන් තනතුරු 223 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ තුළ ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 03 ක්, මධ්‍යම කළමනාකරණ මට්ටමේ සහකාර අධ්‍යක්ෂ තනතුරු 19 සහ මෙහෙයුම් මට්ටමේ විමර්ශණ නිලධාරි තනතුරු 132 ක් විය | රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳව ජනාධිපති කාර්යාලයේ සහ මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අනුව සේවක බඳවාගැනීම් කල් තැබිය යුතුව තිබුණු බැවින්, බඳවා ගැනීම් ප්‍රමාද කළ බව සඳහන් කරමි.<br><br>එසේ වුවද ආයතනික අවශ්‍යතාවය අනුව රාජකාරී කාර්යක්ෂමව හා අඛණ්ඩව සිදුකර ගැනීම සඳහා විමර්ශන නිලධාරීන්ගේ සහාය ද ලබාගෙන ඇත. | අත්‍යාවශ්‍ය ඉහළ කළමනාකරණය හා මෙහෙයුම් මට්ටම්වල තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කරගෙන පනතේ අරමුණු කාර්යක්ෂමව ඉටු කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පනතේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් අධිකාරියේ 2024 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර තිබූ ක්‍රියාකාරකම් තුනක් ක්‍රියාත්මක කර නොතිබූ අතර එවැනි ක්‍රියාකාරකම් හයක ප්‍රගතිය සියයට 23 ත් 50 ත් අතර මට්ටමක පැවතුණි. | නිලධාරී ඌනතාවය මත ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ප්‍රගතිය ලබාගැනීමට නොහැකි විය. පුරප්පාඩු සඳහා බඳවා ගැනීමෙන් පසු මෙම දෝෂය නිවැරදි වනු ඇත. | යථාර්ථවාදීව සැලසුම් සකස් කළ යුතු අතර සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(ඊ) ඡේදය අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් පැවතිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොතිබුණි. | අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය සඳහා අනුමත අභ්‍යන්තර විගණන තනතුර හා විගණන නිලධාරී තනතුරු දෙක හි පුරප්පාඩු විධිමත් පරිදි පිරවීම සඳහා අධිකාරිය විසින් අමාත්‍යාංශය හරහා අදාළ ආයතන වෙතින් අනුමැතීන් ඉල්ලා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු අඛණ්ඩව කරගෙන යාමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |